සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 - 2024

## පෙරදිග සංගීතය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බිලාවල් හා භූපාලි රාගයන් හි යෙදෙන ස්වර සියල්ලම
    - i ශුද්ධ ස්වර වේ.
    - ii කෝමළ ස්වර වේ.
    - iii තීව්‍ර ස්වර වේ.
    - iv විකෘති ස්වර වේ.

02. මිශ්‍ර මත් කැටි වලින් යුත් හින්දුස්ථානි තාලයකි.
    - i දාදරා තාලය
    - ii කෙහෙර්වා තාලය.
    - iii ලාවණී තාලය.
    - iv ජප් තාලය.

03. ස්වර පුවරු සහිත වාද්‍ය භාණ්ඩයක් නොවන්නේ
    - i සර්පිනාව ය.
    - ii මෙලෝඩිකාව ය.
    - iii වයලීනය.
    - iv එකෝඩියන ය.

04. හින්දුස්ථානි සංගීත පද්ධතියට අයත් තත් 07 කින් යුත් සංගීත භාණ්ඩය කුමක්ද?
    - i එස්රාජය.
    - ii සිතාරය.
    - iii වයලීනය.
    - iv ගිටාරය.

05. නව නාට්‍ය ගීතයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    - i සුවඳ පද්ම ඕළු ආදි ...
    - ii සිරස නමමු මව් පොළොවට
    - iii දියගොඩ සැම තැන කිරි ඉතිරේ
    - iv අන්න බලන් සඳ රන් තැටියෙන් සුදු

06. කෙත හා බැඳුනු ගැමි ගීතයකි.
    - i රන් දෑ කැති ගෙන නිති සැරසෙනවා ...
    - ii දොඩම් කපාලා ඇඹුල් තනාලා ...
    - iii ඔන්න මලේ ඔය නාමල නෙලා වරෙන් ...
    - iv උඩ තියරෙන් වැටීගෙනේ ...

07. නූර්ති නාට්‍ය ගී සඳහා යොදා ගන්නා ප්‍රධාන ස්වර හා තාල වාද්‍ය භාණ්ඩ පිළිවෙළින්
    - i සර්පිනාව හා දවුල ය.
    - ii සර්පිනාව හා තබ්ලාව ය.
    - iii ගැටබෙරය හා සර්පිනාව ය.
    - iv තම්මැට්ටම හා සර්පිනාව ය.

08. හින්දුස්ථානි තාලයක සමග්‍රහය (x) හා ඛලිය (o) හැරුණු විට ඉතිරි තාල ස්ථාන හඳුන්වනුයේ
    - i විභාග නමිනි
    - ii ආවර්ථ නමිනි
    - iii අනුතාල ස්ථාන නමිනි
    - iv යේකාව නමිනි

09. සරල ගීතයක ආකෘතිය පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න
    - i පෙරවාදනය, ස්ථායි, අතුරු වාදනය, අන්තරා.
    - ii පෙරවාදනය, අතුරු වාදනය, ස්ථායි, අන්තරා.
    - iii ස්ථායි පෙරවාදනය, අන්තරා, අතුරුවාදන.
    - iv අන්තරා පෙරවාදනය, ස්ථායි අතුරු වාදනය.

10. චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ, විසින් නිෂ්පාදනය කරන ලද නාඩගම් දෙකක් වන්නේ,

i වෙස්සන්තර හා කාලගෝල ය.
ii ඇහැලේපොල හා බැලසන්ත ය.
iii ඉයුජින් හා බ්‍රම්පෝට් ය.
iv හුණුකොටුව හා සුළඹවති ය.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(නාඩගම්, භූපාලි රාගාශ්‍රිත ස්වරස්ථාපන, නූර්ති, අම්මා සඳකි ..., රාධේ ගෝවින්ද ...)

11. "ඇහැළ මහට ඇහැළ ගහක" යන ගීතය ................................ ගීතයකි.
12. "බෝ දොස් කියා මාගේ" යන ගීතය ................................ ගීතයකි.
13. පියගුණ ඇතුළත් ගීයක් ලෙස ................................ ගීතය දැක්විය හැකියි.
14. ................................ යන ගීතය භජන් ගීතයකි.
15. "පායාලා අඹරේ චන්ද්‍රයා දිසි" යන ගීතය ..................................... ගීතයකි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාළව දී ඇති ප්‍රකාශ නිවැරදි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද යොදන්න.**

16. "නෙළුම් ගී" කාන්තාවන් වැඩි වශයෙන් ගායනා කරන ගී විශේෂයකි. (      )
17. x x / x x x/ x x / x x x / මෙම රිද්ම රටාව දීප්චන්ද තාලයට අයත් වේ. (      )
18. "ඔලිඳ තිබෙන්නේ" මෙහි සඳැස්මත් ගණන මාත්‍රා 8 කි. (      )
19. සිතාරය හා එස්රාජය යන සංගීත භාණ්ඩ වල ස්වර පිහිටීම සමාන වේ. (      )
20. බටහිර සංගීතයේ භාවිතා වන  (minim) සංකේතයේ වටිනාකම මාත්‍රා 4කි. (      )

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. i. භූපාලි රාගයේ ආරෝහණ හා අවරෝහණ ස්වර ලියා දක්වන්න. (ල. 2)
    ii. බිලාවල් හෝ භූපාලි යන රාගවලින් එක් රාගයකට අයත් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක් නියමිත තාලයට අනුව ගීත ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ල. 8)

02. i. මාත්‍රා 10 කින් හා මාත්‍රා 14 කින් යුක්ත හින්දුස්ථානි තාල දෙක පිළිවෙලින් නම් කරන්න. (ල. 2)
    ii. ඉහත එක් තාලයක් නම් කර නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 8)

03. i. ගැමි ගී වල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ තුනක් නම් කරන්න. (ල. 6)
    ii. නෙළුම් හෝ කමත් ගීතයක් ලියා දක්වන්න. (පාද 4 ක්) (ල. 4)

04. i. නූර්ති නාට්‍ය නිෂ්පාදකවරුන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)
    ii. නූර්ති නාට්‍ය දෙකක් සහ නව නාට්‍යය දෙකක නම් ලියන්න. (ල. 4)
    iii. නූර්ති හෝ නාඩගම් ගීතයක් ලියා දක්වන්න. (ල. 4)

05. i. බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ දී යොදා ගන්නා රේඛා මණ්ඩලයක් ඇඳ ඒ මත O (Semibrave) සෙම්බ්‍රීව් සංකේතය මගින් ශුද්ධ ස්වර සප්තකය ලකුණු කරන්න. (ල. 6)
    ii. පහත දක්වා ඇති බටහිර සංගීතයේ භාවිතා වන සංකේත වල නම් අදාල අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

i.  ii.  iii.  iv. 

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 - 2024

## පෙරදිග සංගීතය

පිළිතුරු පත්‍රය

නම / විභාග අංකය:

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. I | 06. I | 11. භූපාලි රාගාශ්‍රිත ස්වර ස්ථාපන | 16. √ |
| 02. IV | 07. II | 12. නූර්ති ගී | 17. X |
| 03. III | 08. III | 13. අම්මා සඳකි | 18. √ |
| 04. II | 09. I | 14. රාධේ ගෝවින්ද | 19. √ |
| 05. IV | 10. I | 15. නාඩගම් | 20. X |

### II කොටස

01. I ස රි ග ප ධ සं
ස්ं ධ ප ග රි ස (ල. 2)

II බිලාවල් හෝ භූපාලි රාගාශ්‍රිත ස්වරස්ථාපන ගීතය ස්වර ප්‍රස්තාර ඇත්නම් (ලකුණු 08 කි)
(ගීතය පමණක් ප්‍රස්තාර කර ඇත්නම් ලකුණු 04 ක් හිමි වේ.) (ල. 2)

02. I මාත්‍රා 10 - ඣප් තාලය
මාත්‍රා 14 - දීප්චන්දි තාලය (ල. 1 X 2 = 2)

II තාලයෙහි මාත්‍රා ඓකාව තාල සංඥා සහිතව ප්‍රස්තාර කර ඇත්නම් පමණක් ලකුණු 08 කි.
(මාත්‍රා හා ඓකාව පමණක් ඇත්නම් ලකුණු 04 කි.)

03. I ගැමි ගීවල සුවිශේෂී ලක්ෂණ 03 ක් ලියා ඇත්නම් ලකුණු 2x3 06 කි.

II නෙළුම් හෝ කමත් ගීයක පාද 04 ම ලියා ඇත්නම් ලකුණු 04ක් හිමි වේ.

04. I නූර්ති නිෂ්පාදකයින් දෙදෙනකු ලියා ඇත්නම් ලකුණු 02කි. (ල. 1 X 2 = 2)

II නව නාට්‍ය 02ක්, නූර්ති 02ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 1 X 4)
නූර්ති හෝ නාඩගම් ගීතය ලියා ඇත්නම් ලකුණු 04ක් හිමි වේ.

05. I රේඛා මණ්ඩලය ඇඳ ස්වර සප්තකය ලකුණු කර ඇත්නම් ලකුණු 06ක් ලබා දෙන්න.

II බටහිර සංගීතයේ යෙදෙන සංකේතවලට එක් සංකේතයකට එක් ලකුණක් බැගින් ලකුණු 04කි.

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 - 2024

## පෙරදිග සංගීතය

ප්‍රායෝගික පරීක්ෂණය

නම / විභාග අංකය:

01. බිලාවල් හෝ භූපාලි රාගාශ්‍රිත ස්වරස්ථාපන ගීතයක් ගායනය හෝ වාදනය කරන්න. (ල 10)

02. නිර්දේශිත තාල අතුරින් (ත්‍රිතාල්, කෙහෙර්වා, ඣප්, දීප්චන්දි) කැමති තාල පදයක් අත්ලෙන් තාල යොදා පෙන්වන්න. (ල 10)

03. නෙළුම් හෝ කමත් ගීයක් ගායනය කරන්න. (ල 10)

04. නූර්ති, නාඩගම්, නව නාට්‍යය හෝ භජන් ගීතයක් ගායනය/වාදනය කරන්න. (ල 10)

05. ස්වර පුවරුවෙන් ස්වර අභ්‍යාසයක් හෝ ගීතයක් වාදනය කරන්න. (ල 10)